# ටෙන්ඩර් කැඳවීම
# වාහන සේවා කිරිම - 2018 වසර
# ශ්‍රී ලංකා යුද්ධ හමුදාව

යුද්ධ හමුදාව සතු **වාහන** 2018 වසර තුලදි ණය පදනම මත සේවා කිරිම සඳහා මිළ ගණන් පත් කැඳවනු ලැබේ.

**කොන්දේසි**

1. යුද හමුදා වාහන සේවා කිරිමේ කාල සීමාව 2018.01.01 දින සිට 2018.12.31 දින දක්වා වේ. මේ සඳහා ඉදිරිපත් කරනු ලබන මිළ ගණන් **2018** සම්පූර්ණ වර්ෂය සඳහාම වලංගු විය යුතු අතර, එම මිළ ගණන් අදාල කාලසීමාව තුලදි කිසිදු අයුරකින් වෙනස් කල නොහැක.

2. **2002.09.30 දිනැති අංක 364 (3) දරණ රාජ්‍ය මුදල් චක්‍රලේඛණයට අනුව වැට් යටතේ ලියාපදිංචි වී ඇත්නම් ලියාපදිංචි අංකයද හා ඔබ ආයතනය මේ වන විට සක්‍රීයව වැට් බදු ගෙවන බවට දේශිය ආදායම් කොමසාරිස් ජෙනරාල් වෙතින් ලබා ගත් ලිපියක්ද, වැට් සඳහා ලියාපදිංචි වී නොමැති නම් ඒ සඳහා දේශිය ආදායම් කොමසාරිස් ජෙනරාල් වෙතින් ලබාගත් සහතිකයද ටෙන්ඩර් පත්‍රයට අමුණා ඉදිරිපත් කළ යුතුවේ.**

**3.** මිළ ගණන්පත් ඉදිරිපත් කිරිමේදි අදාල ප්‍රදේශය තුල පිහිටි සේවා ස්ථානයන් වෙතින් පහත සඳහන් මූලස්ථානයන්හි ටෙන්ඩර් පෙට්ටියට බහාලීමට කටයුතු කළ යුතුවේ.

**මිළ ගණන්පත් ඉදිරිපත් කළ යුතු ස්ථානයන්**

| | | | |
|---|---|---|---|
| (අ) | දෙපාර්තමේන්තු ප්‍රසම්පාදන කමිටු සභාපති,<br>නො: 31, කිව් පාර, මැලේ විදිය, කොළඹ 02 | - | මහ කොළඹ ආර්ථික ප්‍රදේශය තුල පිහිටි සේවා ස්ථානයන් |
| (ආ) | ප්‍රාදේශිය ප්‍රසම්පාදන කමිටු සභාපති,<br>ආරක්ෂක සේනා මූලස්ථානය (යාපනය)<br>යුහ කඳවුර, පලාලි. | - | යාපනය දිස්ත්‍රික්කය තුල පිහිටි සේවා ස්ථානයන් |
| (ඇ) | ප්‍රාදේශිය ප්‍රසම්පාදන කමිටු සභාපති,<br>ආරක්ෂක සේනා මූලස්ථානය (වන්නි)<br>යුහ කඳවුර රණසේවාපුර, අනුරාධපුරය. | - | අනුරාධපුරය, වව්නියාව, මන්නාරම, හා පුත්තලම,<br>දිස්ත්‍රික්කයන් තුල පිහිටි සේවා ස්ථානයන් |
| (ඈ) | ප්‍රාදේශිය ප්‍රසම්පාදන කමිටු සභාපති,<br>ආරක්ෂක සේනා මූලස්ථානය (නැගෙනහිර)<br>යුහ කඳවුර, මහසෙන්පුර, මින්නේරිය. | - | පොලොන්නරුව, මඩකලපුව, අම්පාර, හා ත්‍රිකුණාමලය,<br>දිස්ත්‍රික්කයන් තුල පිහිටි සේවා ස්ථානයන් |
| (ඉ) | ප්‍රාදේශිය ප්‍රසම්පාදන කමිටු සභාපති,<br>ආරක්ෂක සේනා මූලස්ථානය (කිලිනොච්චි)<br>යුහ කඳවුර, කිලිනොච්චිය. | - | කිලිනොච්චි දිස්ත්‍රික්කයන් තුල පිහිටි සේවා ස්ථානයන් |
| (ඊ) | ප්‍රාදේශිය ප්‍රසම්පාදන කමිටු සභාපති,<br>ආරක්ෂක සේනා මූලස්ථානය (මුලතිව්)<br>යුහ කඳවුර, නන්දිකඩාල්, මුලතිව්. | - | මුලතිව් දිස්ත්‍රික්කය තුල පිහිටි සේවා ස්ථානයන් |
| (උ) | ප්‍රාදේශිය ප්‍රසම්පාදන කමිටු සභාපති,<br>ආරක්ෂක සේනා මූලස්ථානය (බටහිර) | - | කෑගල්ල, ගම්පහ, කළුතර, රත්නපුර, පුත්තලම, කුරුණෑගල<br>ගාල්ල හා මාතර දිස්ත්‍රික්කයන් තුල පිහිටි සේවා ස්ථානයන් |
| (ඌ) | ප්‍රාදේශිය ප්‍රසම්පාදන කමිටු සභාපති,<br>ආරක්ෂක සේනා මූලස්ථානය (මධ්‍යම)<br>යුහ කඳවුර, දියතලාව. | - | මහනුවර, මාතලේ, බදුල්ල, නුවරඑළිය, මොණරාගල හා<br>හම්බන්තොට දිස්ත්‍රික්කයන් තුල පිහිටි සේවා ස්ථානයන් |

4. ඒ ඒ වාහන කාණ්ඩයන් වෙනුවෙන් එක් වාහනයක් සේවා කිරීම සඳහා වැයවන මුදල වැට් රහිතව සහ වැට් මුදල වෙන් වෙන් වශයෙන් පහත සඳහන් කර ඇති උදාහරණයේ පරිදි අදාළ ටෙන්ඩර් අයදුම්පතේ එම වාහන කාණ්ඩයට ඉදිරියෙන් පැහැදිලි ලෙස මිළ ගණන් සඳහන් කල යුතුවේ.

උදා :

| | සේවා කිරීම | | ඔයිල් ෆිල්ටර් මාරුකිරීම | | එන්ජින් ඔයිල් මාරුකිරීම | |
|---|---|---|---|---|---|---|
| | වැට් රහිත මුදල | වැට් මුදල (15%) | වැට් රහිත මුදල | වැට් මුදල (15%) | වැට් රහිත මුදල | වැට් මුදල (15%) |
| ටොයෝටා හයිලක්ස් 4x2 ඩබල් කැබ් | 1500.00 | 225.00 | 2500.00 | 375.00 | 4500.00 | 675.00 |

5. ටෙන්ඩර් පත්‍රිකාව සුරා හෝ මකා වෙනස් කරන ලද මිළ ගණන් පත් ටෙන්ඩර් මණ්ඩලය විසින් ප්‍රතික්ෂේප කරනු ලැබේ.

6. සම්පූර්ණ කරන ලද මිළ ගණන් පතට ටෙන්ඩර්කරුගේ අත්සන හා නිල මුද්‍රාව අනිවාර්යයෙන්ම තැබිය යුතුවේ.

7. ආකෘති පත්‍රයේ සඳහන් සේවාවන් නිසි පරිදි ඉටුකිරීමට අවැසි පහසුකම් ඔබ ආයතනය සතුවිය යුතුවේ.

8. **සේවාව අවසානයේදී යුධ හමුදා නියෝජිතයෙකු විසින් අදාල වාහනයන් පරීක්ෂා කරනු ලබන අතර එම සේවාව නිසි අයුරු ඉටුවී නොමැති බවට නිරීක්ෂණය වුවහොත් අදාළ සේවාව නැවත නොමිලේ ඉටුකර දිය යුතුවේ.**

9. ඔබ ආයතනය විසින් සිදුකරනු ලබන සේවාවන් අසතුටුදායක වේ නම් අදාල ටෙන්ඩරය අවලංගු කිරීමට කටයුතු කරනු ලැබේ.

10. ටෙන්ඩර්කරු විසින් සතියේ ඔනෑම දිනයක යුහ වාහන සේවා කිරීම සඳහා එකග විය යුතුය.

11. ඔබ වෙතින් ඉදිරිපත් කරනු ලබන ඇස්තමේන්තුවල ටෙන්ඩරය අනුමත වීමෙන් පසුව අප විසින් නිකුත් කරනු ලබන කාර්‍යය නියෝගයේ සඳහන් වන සේවාව පමණක් ඉටුකල යුතුවේ. ඊට අමතරව ඔබ විසින් ඉදිරිපත් කරනු ලබන අමතර ඇස්තමේන්තු සඳහා කිසිදු මුදලක් ගෙවනු නොලැබේ.

12. මිළ ගණන්පත් ඉදිරිපත් කිරීමේදී ඒ සඳහා අවැසි මිළ ගණන්පත්‍රය හා ටෙන්ඩර්කරුගේ විස්තරය යුධ හමුදා වෙබ් අඩවිය ඔස්සේ හෝ පහත සඳහන් විදුලි හා යාන්ත්‍රික ඉංජිනේරු බළඇණි වෙතින් ලබාගත හැකිවේ.

(අ) යුධ හමුදා වෙබ් අඩවිය — www.army.lk/tenders.php

(ආ) සේනාවිධායක, වියාඉ මූලික වැඩපල - කොළඹ
පාර්සන් පාර, කොළඹ 02.
දුරකථන අංක - 0112 436477
ෆැක්ස් - 0112 436477
→ මහ කොළඹ ආර්ථික ප්‍රදේශයට අයත් සේවා ස්ථානයන්

(ඇ) අණදෙන නිලධාරි, 1 බළඇණිය - ශ්‍රීලවියාඉ
යුහ ජනපදය, පනාගොඩ, හෝමාගම.
දුරකථන අංක - 0112 855463
ෆැක්ස් - 0112 855463
→ කෑගල්ල, ගම්පහ, කුරුණෑගල, රත්නපුර, කළුතර, පුත්තලම, ගාල්ල, මාතර දිස්ත්‍රික්කයන්ට අයත් සේවා ස්ථානයන්

(ඈ) අණදෙන නිලධාරි, 3 බළඇණිය - ශ්‍රීලවියාඉ
මහසෙන්පුර, මින්නේරිය
දුරකථන අංක - 027 2247322
ෆැක්ස් - 027 2247322
→ පොළොන්නරුව, මඩකලපුව, අම්පාර, ත්‍රිකුණාමලය, දඹුල්ල බළප්‍රදේශයන්ට අයත් සේවා ස්ථානයන්

(ඉ) අණදෙන නිලධාරි, 4 බළඇණිය - ශ්‍රීලවියාඉ
කන්කසන්තුරය.
දුරකථන අංක - 021 3213036
021 3212937
ෆැක්ස් - 021 3215177
→ යාපනය දිස්ත්‍රික්කයට අයත් සේවා ස්ථානයන්

(ඊ) අණදෙන නිලධාරි, 5 බළඇණිය - ශ්‍රීලවියාඉ
සාලිය පුර, අනුරාධපුර.
දුරකථන අංක - 025 2220935
ෆැක්ස් - 025 2222898
→ අනුරාධපුරය, වව්නියාව, මන්නාරම හා පුත්තලම දිස්ත්‍රික්කයන්ට අයත් සේවා ස්ථානයන්

(උ) අණදෙන නිලධාරි, 6 බළඇණිය - ශ්‍රීලවියාඉ
යුහ කඳවුර, මුලතිව්.
දුරකථන අංක - 024 3244673
→ මුලතිව් දිස්ත්‍රික්කයට අයත් සේවා ස්ථානයන්

(ඌ) අණදෙන නිලධාරී, 7 බලඇණිය - ශ්‍රීලවියාභ යුහ කඳවුර, කිලිනොච්චි. දුරකථන අංක - 025 3242790 } කිලිනොච්චි දිස්ත්‍රික්කයට අයත් සේවා ස්ථානයන්

(එ) අණදෙන නිලධාරී, 2 (සෙව්) බලඇණිය - ශ්‍රීලවියාභ යුහ කඳවුර, උඩවැව, කහගොල්ල, දියතලාව. දුරකථන අංක - 057 2224633 } මහනුවර, මාතලේ, බදුල්ල, නුවරඑළිය, මොණරාගල හා හම්බන්තොට දිස්ත්‍රික්කයන්ට අයත් සේවා ස්ථානයන්

13 සම්පූර්ණ කරන ලද මිල ගණන්පත් මුල්පිටපත සමග පිටපත් **03** කින් යුතුව මුද්‍රා තබා ඉදිරිපත් කල යුතු අතර, **2017 සැප්තැම්බර් මස 27 දින පෙ:ව 1000 පැයට** ප්‍රථම ජේද අංක **03** හි සඳහන් ස්ථානයෙහි ටෙණ්ඩර් පෙට්ටි වෙත බහාලීමට කටයුතු කල යුතුවේ. තවද මිලගණන් ඉදිරිපත් කරනු ලබන ලිපියෙහි වම්පස ඉහළ කෙලවරේ **"යුද හමුදා වාහන සේවා කිරීම - 2018 වසර"** යනුවෙන් සඳහන් කර ආයතනයේ නිල මුද්‍රාව තැබිය යුතු අතර, නියමිත දින දක්වා ඇති වේලාවට පසුව ඉදිරිපත් කරනු ලබන මිල ගණන් පත් විවෘත කිරීමෙන් තොරව ප්‍රතික්ෂේප කරනු ලැබේ. තවද ටෙන්ඩර් භාර ගැනීම අවසන් වූ වහාම එම ටෙන්ඩර් පත් විවෘත කරනු ලබන අතර, ඒ සඳහා ටෙන්ඩර්කරුට හෝ ටෙන්ඩර්කරු විසින් බලය පවරනු ලබන වෙනත් අයකුට ඉදිරිපත් විය හැකිය.

.................................................................

යුද්ධ හමුදාධිපති - ශ්‍රී ලංකා යුද්ධ හමුදාව

## ටෙන්ඩර්කරුගේ විස්තරය

(සේවා ආයතනයේ නම සහ ලිපිනය)

……………………………………
……………………………………
……………………………………

වියාඉ/අම/සේවා/ටෙන්ඩර්/04(      )

දුරකථන අංකය :-
2017/      /        දින

සභාපති - ටෙන්ඩර් මණ්ඩලය
……………………………………
……………………………………
……………………………………

**වාහන සේවා කිරීම සඳහා මිල ගණන්පත් ඉදිරිපත් කිරීම - ……………………………….. ප්‍රදේශය 2018 වසර**

1. ටෙණ්ඩර්කරුගේ නම :- ……………………………………………………………………………………..

2. ජාතික හැඳුනුම්පත් අංකය :- ……………………………………………………………………………..

3. ලිපිනය :- ……………………………………………………………………………………………......

4. සේවා ආයතනයේ වෙළඳ නාමය :- ……………………………………………………………………......

5. මාගේ සේවා ආයතනය පිහිටා ඇත්තේ :-…………………………………………………………………....
මහනගර සභා/නගරසභා/ප්‍රාදේශීය සභා බල ප්‍රදේශයේය

6. දුරකථන අංකය :- ……………………………………… 7 ෆැක්ස් අංකය :- ………………...………

8. වෙළඳ ව්‍යාපාරයක් ලෙස ලියාපදිංචි කර ඇත්නම් ලියාපදිංචි අංකය :- ………………..……………………………

9. වැට් සඳහා ලියාපදිංචි වී ඇත්නම් එහි අංකය :- ……………………………………………………………
(වැට් සඳහා ලියාපදිංචි වී නොමැතිනම් දේශීය ආදායම් කොමසාරිස් ජෙනරාල් වෙතින් නිකුත් කරන ලද ලිපියේ පිටපතක් ඇමිණිය යුතුයි)

10. මාගේ සේවා ආයතනයේ සිට බලයලත් යුහ කඳවුරට ඇති දුර ප්‍රමාණය කි:මී ………………………………………..

11. සැපයුම්කරුවෙකු වශයෙන් රාජ්‍ය ආරක්ෂක අමාත්‍යාංශයේ ලියාපදිංචි වී ඇත/නැත ……………………………..

ලියාපදිංචි වී ඇත්නම් ලියාපදිංචි වූ අංකයː……………………………………………………...……….

12. ඔබ ආයතනයේ ඇති හොයිස්ටර් ප්‍රමාණය සහ ධාරිතාවය :- ……………………………………………...

13. දිනකට සේවා කල හැකි සියලුම වාහන ගණන :- බර වාහන ………………සැහැල්ලු වාහන ……………………….

14. දිනකට සේවා කල හැකි යුද හමුදා වාහන ගණනː- බර වාහන ….……………… සැහැල්ලු වාහන …………………..…

15. ඔබ ආයතනයේ වැඩ කරන සේවකයන් සංඛ්‍යාව :-

……………………………………………….…………………………

16. මෙම අයදුම්පත සමග ලබාදුන් කොන්දේසි කියවා බැලූ අතර එහි සඳහන් කොන්දේසි හා එකග වන බැව් මින් පොරොන්දු වෙමි තවද ………………………………බල ප්‍රදේශයේ යුද හමුදා කඳවුරුවලට අයත් පහත දක්වා ඇති මාදිලියේ යුද හමුදා වාහන 2018/01/01 සිට 2018/12/31 දක්වා සේවා කිරීම සඳහා ඉදිරිපත් කරනු ලබන මිලගණන් පහත දක්වා ඇති අතර මෙම මිල ගණන් කුමන හේතුවක් නිසාවත් අදාල වර්ෂය තුළදී සංශෝධනය නොකරන බවත් ණය පදනම යටතේ වාහන සේවා කිරීමට කැමති බවත් මා මෙයින් ප්‍රකාශ කරමි.

ටෙන්ඩර්කරුගේ අත්සන :-…………………….......……

නම :-…………………….......……

2017/      /      දින

නිල මුද්‍රාව :-…………………….......……